026

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 09- ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

නම/විභාග අංකය :- ..................................................................... කාලය: පැය 02 යි.

I කොටස

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ස රි ග ම ප ධ නි ලෙස ශුද්ධ ස්වර 07 යෙදෙන මේලය කුමක් ද?

(1) බිලාවල් (2) කාෆි (3) කල්‍යාණ (4) භෛරවි

(02) ඉන්දීය ගසල් ගායනයේ දී, තුර්ති සංගීතයේ දී වත්මන් පැදුරු සාජ්ජවලදී බහුලව යොදා ගන්නා ස්වර වාද්‍ය භාණ්ඩයකි.

(1) ඕගන් (2) එකෝඩියන් (3) හර්මෝනියම් (4) ගිටාරය

- පහත දැක්වෙන ස්වර ඇසුරෙන් 3, 4, 5, 6 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ග රි ග රි , ස රි ග ප , ග ප ග ප , ධ ස ධ ප , ග රි ග රි , ස රි ග

(03) ඉහත ස්වර සංගතියට අයත් රාගය වන්නේ,

(1) බිලාවල් (2) භූපාලි (3) කාෆි (4) භෛරවි

(04) ඉහත රාගයේ වාදී ස්වරය වනුයේ,

(1) ෂඩ්ජය (2) රිෂභය (3) ගාන්ධාරය (4) පංචමය

(05) ඉහත රාගයේ මධ්‍යමය සහ නිශාදය යන ස්වර දෙක

(1) වර්ජිතය (2) විවාදිය (3) සංවාදිය (4) අනුවාදිය

(06) ඉහත රාගය අයත් ජාතිය වනුයේ,

(1) සම්පූර්ණ සම්පූර්ණ (2) ෂාඩව ෂාඩව (3) ඖඩව, ඖඩව (4) ඖඩව සම්පූර්ණ

(07) ගිටාරයේ තත් හය ප්‍රසර කර ඇති ස්වර පිළිවෙලින් තෝරන්න.

(1) EADGBE (2) EAGDBE (3) EGDABE (4) EBEADE

(08) ස්වර පුවරුවෙන් ගීත තනුව වයන විට බැලෙන්සේ ඇති බොත්තම්වලින් රිද්මයානුකූලව ස්වර (chords) වාදනය කළ හැකි භාණ්ඩය

(1) එකෝඩියන් (2) හර්මෝනියම් (3) පියානෝ (4) මෙලෝඩිකා

(09) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් ගීතයක් නොවන්නේ,

(1) මුළු ගතම වෙහෙසුනා (2) රුවන් පුරේ අපේ ගම තමයි

(3) මංගෝ කළු නැන්දේ (4) සසර වසන තුරු

(10) ප ප ග / ම ම රි / ග ග ස / රි - -

යන ප්‍රස්තාරය බටහිර ප්‍රස්තාර කරනයේදී උචිත තාල සංකේතය (Time signature) වන්නේ,

(1) $4_4$ (2) $3_4$ (3) $2_4$ (4) $6_8$

(11)  මෙම B♭ මේජර් ස්කේලයට අයත් Key signature අනුව මෙම ප්‍රස්තාරයේ,

(1) ග නි කෝමල වේ. (ග නි)
(2) ග නි ශුද්ධ වේ. (ග නි)
(3) ග ධ කෝමල වේ. (ග ධ)
(4) ග ධ ශුද්ධ වේ. (ග ධ)

(12) දොළොස්මහේ පහන් නම් ගීත අංගය යෙදෙන නූර්ති ගීතයක් වන්නේ,

(1) අහෝ දූත වාස්ට බෑ දැන් මගේ... ගීතයයි.
(2) ආරක්ෂෝ ඉන්නා මේ රමයා... ගීතයයි.
(3) සිරි සඟබෝධි මාලිගාවෙදී... ගීතයයි.
(4) වාසනා දිනේකී මේක... ගීතයයි.

(13) පුංචුවටය, තාරාවෝ ඉගිලෙති, නලදමයන්ති, දෙපාණෝ, නව නාට්‍ය අතරින් කිහිපයකි. මේ අතර ජන ගී තනු ඇසුරින් නිර්මාණය කළේ,

(1) පුංචුවටය නාට්‍යයි.
(2) තාරාවෝ ඉගිලෙති නාට්‍යයි.
(3) නල දමයන්ති නාට්‍යයි.
(4) දෙපාණෝ නාට්‍යයයි.

(14) "ග ප, ම ග ම රි ස" යන ස්වර සංගතිය අයත් වනුයේ,

(1) බිලාවල් රාගයටයි.
(2) කාෆි රාගයටයි.
(3) භූපාලි රාගයටයි.
(4) භෛරවී රාගයටයි.

(15) දැකට වළලු, වන්නම් සවුදම්, මල්පරා මැල්ම තෙලා, රුක් අත්තන මල මුදුනේ... යන ගීත ජන ගී තනු ඇසුරින් සරල ගීත වේ.
මින් නෙළුම් ගී තනුව පාදක කරගත් නීලා වික්‍රමසිංහයන් ගායනයට දායක වන ගීතය වන්නේ,

(1) දැකට වළලු
(2) වන්නම් සවුදම්
(3) මල්පරා මැල්මතෙලා
(4) රුක් අත්තන මල මුදුනේ

(16) ගැටබෙරය, දවුල, තම්මැට්ටම, හොරණෑව, යක්බෙරය යන අවනද්ධ භාණ්ඩ දේශීය භාණ්ඩ වර්ගීකරණය අනුව අයත් වන්නේ,

(1) ආතත, විතත, විතතාතත, ශුෂිර, ආතත
(2) ආතත, විතතාතත, විතත, ශුෂිර, ආතත
(3) ආතත, ශුෂිර, විතත, විතතාතත, ආතත
(4) ආතත, විතත, ශුෂිර, විතතාතත, ආතත

(17) පාසල් වේදිකාවේ ප්‍රාසාංගික අවස්ථාවක දී තාක්ෂණික මෙවලම් භාවිතය වැදගත් වේ. ශබ්දය ග්‍රහණය කරගැනීමේ සිට බාහිර පරිසරයට මුදා හැරීම දක්වා යොදාගන්නා තාක්ෂණික මෙවලම් පටිපාටිය පිළිවෙල තෝරන්න.

(1) මයික්‍රොෆෝනය, මික්සරය, ඇම්ප්, බෆල්
(2) මයික්‍රොෆෝනය, බෆල්, මික්සර්, ඇම්ප්
(3) මයික්‍රොෆෝනය, ඇම්ප්, බෆල්, මික්සර්
(4) මයික්‍රොෆෝනය, මික්සර්, බෆල්, ඇම්ප්

(18) ස රි / පා - ර / අ ති / ශා න් ත /
මෙම ගී පාදයට ගැළපෙන හින්දුස්ථානි තාලය සහ දේශීය තිත වනුයේ,

(1) ත්‍රිතාලය හා මහ තනි තිතයි.
(2) දීප්චන්දී තාලය හා මැදුම් මහ දෙතිතයි
(3) ඊප් තාලය හා පුළු මැදුම් දෙතිතයි.
(4) දාදරා තාලය හා මැදුම් තනි තිතයි.

(19) දේශීය ජන ගායනා හා සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A. මහනුවර යුගයේ පෝෂණය විය.
B. දකුණු ඉන්දීය සංගීත ආභාෂය ලැබී ඇත.
C. සංකීර්ණ නාද මාලාවලින් යුක්ත ය.

ඉහත A, B, C කරුණුවලට පොදු ගායනාවන් වනුයේ,

(1) ප්‍රශස්ති, හටන් කාව්‍ය, නූර්ති
(2) වන්නම්, හටන් කාව්‍ය, නූර්ති
(3) ප්‍රශස්ති, නූර්ති, වන්නම්
(4) වන්නම්, ප්‍රශස්ති, හටන් කාව්‍ය

(20) පහත දැක්වෙනුයේ C, F, G මේජර් ස්කේලයන්ට අයත් ස්වරයි.

C - ස රි ග ම ප ධ නි ස
F - ම ප ධ නි ස රි ග ම
G - ප ධ නි ස රි ග ම ප

ඉහත F මේජර් හා G මේජර් ස්කේලයන් නිවැරදි වීමට යෙදිය යුතු ස්වර වනුයේ,

(1) තීව්‍ර ම සහ කෝමල රි
(2) කෝමල නි සහ තීව්‍ර ම
(3) කෝමල ධ සහ කෝමල ග
(4) තීව්‍ර ම සහ කෝමල ධ

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) පහත දක්වා ඇත්තේ නිර්දේශිත රාග තුනකට අයත් මුඛ්‍යාංගයන් ය.

A - ගරි, ගප, ධ, නිස

B - සසරිරි, ගගමම, ප -

C - ගරි, සධ, සරිග, පග, ධපග, රිස

(i) ඉහත මුඛ්‍යාංගයට අයත් රාග පිළිවෙලින් නම් කරන්න.

(ii) ඉහත රාග අතරින් A හෝ B රාගයේ,
ආරෝහණ / අවරෝහණ / මේලය / ජාතිය / වාදී / සංවාදී ස්වර ලියන්න.

(iii) මින් ඔබ කැමති රාගයක මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කරන්න.

(02) (i) ස්වර පුවරු සංගීත භාණ්ඩ අතර ජනප්‍රිය භාණ්ඩයක් වන පර්පිනාව පැරණි සංගීතඥයන් මුලුලව යොදාගත් අවස්ථා තුනක් ලියන්න.

(ii) ප ප ම ම / ග ග රි රි / ස රි ග ම / ප - - - / මෙම ස්වර පාදය මධ්‍යම භාවයෙන් හා පංචම භාවයෙන් ලියන්න.

(iii) අපරදිග සංගීත භාණ්ඩ ප්‍රධාන වශයෙන් බෙදා ඇති කොටස් තුන නම් කරන්න.

(iv) මින් ඔබ කැමති එක් කොටසක් සඳහා නිදසුන් දෙකක් ලියා දක්වන්න.

(03) පහත දක්වා ඇත්තේ මෙරට ප්‍රචලිත ජන ගී අතර සේ ගී වර්ගයට අයත් ගී පද තුනකි.

A - මෝරා බිජයෙනා

B - ලක්ෂ්මි බුජ වාසා

C - තොමදින් විතුම් පාලා

(i) එම ගීත වර්ග තුන නම් කරන්න.

(ii) නම් කරන ලද ගීවලට පොදු වූ සුවිශේෂී ලක්ෂණ හතරක් ලියන්න.


(iii) එම ගී අතුරින් ඔබ කැමති එක් ගීයක මුල් කොටස ලියන්න.

(iv) ඉහත ගී වර්ග අතරින් තානමක් සහිතව ගැයෙන ගී වර්ගය නම් කරන්න.

(04) (i) පෙරදිග සංගීතයේ යෙදෙන ශුද්ධ ස්වර කෝමල ස්වර හා තීව්‍ර ස්වර බටහිර සංගීතයේ දී හඳුන්වන නම් හා සංකේත ලියන්න.

(ii) ග - ම / ප - ග / ම - ග / රි - - - / යන ගී පාදය අපරදිග සංගීත ක්‍රමයට අනුව ප්‍රස්තාර කර ඊට අදාළ Time signature එකද ලියන්න.

(iii) පහත සඳහන් අපරදිග සංගීතයට අයත් සංකේත නම් කරන්න.

(a)  (b)  (c)  (d) 

(iv) $B^{b}$ මේජර් ස්කේලයට අයත් ස්වර ලියන්න.

(05) (i) ලංකාවේ කණ්ඩායම් ගීයේ නිර්මාතෘවරයා කවුද?

(ii) ශ්‍රී ලංකාවේ මුල්ම ගායක කණ්ඩායම් දෙක නම් කරන්න.

(iii) ශ්‍රී පිස්ටරප් සහ ජිප්සීස් කණ්ඩායම් ගැයූ ගීත එක බැගින් නම් කරන්න.

(iv) ලෝක ප්‍රසිද්ධ "ABBA" සංගීත කණ්ඩායම ගැයූ ගීතයක් නම් කරන්න.

(v) ඔබ දන්නා කණ්ඩායම් ගීතයක පාද හතරක් ලියන්න.

(06) වරහන් තුළ ඇති පිළිතුරු තොරතුරු උපයෝගී කර ගනිමින් පහත සඳහන් ඡේද කොටස සම්පූර්ණ කර මෙම පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(යුගලයක්, බැලෝව්, රසෝර්ඩියනය, සුෂිර, තල්ලු කිරීමෙන්)

(i) ......... බටහිරින් ආරම්භව ලොව පුරා ව්‍යාප්ත වී ඇති ස්වර පුවරු භාණ්ඩයකි. මෙය ......... වාද්‍ය භාණ්ඩ ගණයට අයත් ය. මෙහි ......... ඇදීමෙන් හා ......... යන දෙආකාරයෙන්ම ස්වර නිකුත් වන පේ තළා යොදා ඇත. සෑමවිටම එක් ස්වරයක් සඳහා තලා ......... සම්බන්ධ කර ඇත.

(ii) C major හා F major chords වලට අයත් ස්වර ලියන්න.

(iii) විද්‍යුත් ඕගනය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.